**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/93**

රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.05.12 දින

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>ජීවන වියදම් දීමනාව</u>**

1988 අගෝස්තු මස 03 දිනැති අංක 24/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි.

02. රු. 260/- ක ජීවන වියදම් දීමානව පහත සඳහන් විශ්‍රාමික කාණ්ඩ වලට 1993 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවනු ලැබේ.

(අ) 1987.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා ඇති හා අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප වශයෙන් රු. 1600/- ට අඩු මුදලක් ප්‍රදනය කරනු ලැබූ විශ්‍රාමිකයන්ට,

(ආ) 1988.01.01 - 1992.12.31 අතර කාලය තුළදී විශ්‍රාම ලබා ඇති හා අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප වශයෙන් රු. 2975/- ට අඩු මුදලක් ප්‍රදනය කරනු ලැබූ විශ්‍රාමිකයන්ට,

සහ

(ඇ) 1993.01.01 දින සහ ඉන් පසුව විශ්‍රාම ලබා ඇති / විශ්‍රාම ලබන හා අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප වශයෙන් රු. 4060/- කට අඩු මුදලක් ප්‍රදනය කරනු ලැබූ විශ්‍රාමිකයන්ට,

03. මෙම දීමනාව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් සාමාන්‍ය ගෙවීම් කාර්යාල මගින් ගෙවීමට කටයුතු කරනු ඇත.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/ එම්.එන්. ජුනයිඩ්.
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය